# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2133/62 - 2019 ජූලි මස 26 වැනි සිකුරාදා - 2019.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: DIV/MW/LND/3/1/2-15.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ
ගොනු අංකය : 4-3/9/2017/WS/69.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :-

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ අංක 699 දරන, මඩව ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ, පිලැස්ස ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද, අංක කු 2418 හා 2019.02.28 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 හා 2 වශයෙන් සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0796ක් පමණ වූ ඩේසි මවුන්ට් වත්ත නැමැති ඉඩමේ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක :

01. කැබලි අංකය 1

ඉඩමේ නම: ඩේසි මවුන්ට් වත්ත; ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: පල්ලේවත්තේ ගෙදර රංජිත් මහතා, අංක 15, බෙට්ටියගොඩ, කහපත් විල; ප්‍රමාණය: හෙක්. 0.0405ක් පමණ .

ඉඩමේ මායිම් :

උතුරට : අංක 2160 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 123; නැගෙනහිරට: මාර්ගය; දකුණට: අංක කු 2418 දරන මූලික පිඹුරේ කැබලි අංක 2; බටහිරට: කේ. ඒ. පුෂ්පකාන්ති හිමිකම් කියන ඉඩම (සමගි උයන).

02. කැබලි අංකය 2

ඉඩමේ නම: ඩේසි මවුන්ට් වත්ත; ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: හොරතල් ජේඩිගේ සුනිල් වික්‍රමරත්න මහතා, අංක 13, බෙට්ටියගොඩ, කහපත් විල; ප්‍රමාණය: හෙක්. 0.0391ක් පමණ .

ඉඩමේ මායිම් :

උතුරට : අංක කු 2418 දරන මූලික පිඹුරේ කැබලි අංක 1; නැගෙනහිරට: මාර්ගය; දකුණට: ඒ. පී. එන්. ප්‍රියන්ත හිමිකම් කියන ඩේසි මවුන්ට් වත්ත; බටහිරට: කේ. ඒ. පුෂ්පකාන්ති හිමිකම් කියන ඉඩම (සමගි උයන).


1A - G 30607 – 27 (2019/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනා, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 අගෝස්තු මස 21 වැනි දින පෙ.ව. 10.00 ට මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2019 අගෝස්තු මස 13 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඊ. ඒ. එස්. එදිරිසිංහ,
ප්‍රාදේශීය ලේකම් හා
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
මාවතගම,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

2019 ජූලි මස 20 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 433

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.